# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 68 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/01/2024<br>පැය 1515 |

## මාධ්‍ය නිවේදනය

**දිවයින පුරා විවිධ අපරාධ වලට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් ස්ථානවල අපරාධ අංශ නිලධාරීන් යුක්තිය මෙහෙයුමට එක්වෙයි. - පොලිස් මූලස්ථානය.**

වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් 2024.01.14 වන අද දින සිට දිවයින පුරා සියළුම පොලිස් ස්ථානවල අපරාධ අංශවල නිලධාරීන්ද "යුක්තිය" මෙහෙයුමට සම්බන්ධ වන ලෙසට දිවයිනේ සියළුම කොට්ඨාශ භාර නිලධාරීන්, දිස්ත්‍රික් භාර නිලධාරීන්, ස්ථානාධිපතිවරුන් සහ අපරාධ අංශ ස්ථානාධිපතිවරුන් හට උපදෙස් ලබා දෙන ලදී.

**මේ යටතේ දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට ඇති විවෘත වරෙන්තු, ඇඟිලි සටහන් මාධ්‍යයෙන් හඳුනාගෙන මෙතෙක් අත්අඩංගුවට නොගත් සැකකරුවන් සහ අපරාධ වලට අවශ්‍ය කරන සැකකරුවන් ලෙස විවිධ සැකකරුවන් 42200 කට වැඩි සංඛ්‍යාවක ලැයිස්තුවක් පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී ඇත.**

යුක්තිය මෙහෙයුම යටතේ ඉදිරි මාසයක කාලය තුල තම පොලිස් වසම් ආවරණය වන පරිදි මෙහෙයුම් සිදුකර ඉහත සැකකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීමට පැය 24 පුරාම සියළුම අපරාධ අංශ නිලධාරීන් යෙදවිය යුතු බවට වැඩබලන පොලිස්පතිතුමා විසින් වැඩිදුරටත් උපදෙස් ලබාදී ඇත.

විෂ මත්ද්‍රව්‍ය බෙදාහැරීම හා ජාවාරම් කිරීමට අදාල ජාලය මැඩපැවැත්වීමට ආරම්භ කළ යුක්තිය මෙහෙයුමට තවත් ශක්තියක් එක් කිරීම මෙමඟින් අපේක්ෂා කරනු ලබයි.